
# <u>පුවත්පත් නිවේදනය</u>

## 2014 පළමු භාගයේ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය

### දළ ලිඛිත වාරිකය

රක්ෂණ කර්මාන්තය, 2014 ප්‍රථම භාගයේ ද වර්ධනයක් පෙන්නුම් කර ඇත. සමස්ථ දළ ලිඛිත වාරිකය (GWP) 3.07%ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, 2013 වසරේ ප්‍රථම භාගය හා සසඳන විට මුළු වත්කම් 13.0%ක වැඩිවීමක් පෙන්නුම් කරයි.


2014 ජූනි මස 30 වැනි දින දක්වා ගතවූ මාස හයක කාලය තුල, දීර්ඝ කාලීන (ජීවිත) සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල සමස්ත දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 49,216ක් වූ අතර එය 2013 පළමු හය මසක කාලය සඳහා ආදායම වන රුපියල් මිලියන 47,749 හා සසඳන විට 3.07%ක වර්ධනයක් ලෙස දක්වෙයි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 28,761ක් වූ අතර (2013 පළමු භාගයේදී එය රුපියල් මිලියන 28,189කි) දීර්ඝ කාලීන ව්‍යාපාරවල දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 20,455ක් විය (2013 පළමු භාගයේදී එය රුපියල් මිලියන 19,561ව පැවතින). ඒ අනුව, පසුගිය වසරේ අදාල කාලයට සාපේක්ෂව 2014 පළමු භාගයේදී සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවල සමස්ථ දළ ලිඛිත වාරික ආදායම පිළිවෙලින් 2.03%ක සහ 4.57%ක වර්ධනයක් පෙන්නුම් කරයි.




### මුළු වත්කම්

2014 ජූනි 30 වැනි දිනට රක්ෂණ සමාගම්වල මුළු වත්කම් රුපියල් මිලියන 390,918ක් දක්වා වැඩිවීමක් පෙන්නුම් කරන අතර, එය 2013 වසරේ ජූනි 30 වැනි දිනට පැවති රුපියල් මිලියන 345,942ට සාපේක්ෂව 13.0%ක වර්ධනයක් වේ. 2014 පළමු භාගය අවසානයේ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර වත්කම් රුපියල් මිලියන 237,706ක් (2013 ප්‍රථම භාගය අවසානයේ එය රුපියල් මිලියන 210,475කි) වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වත්කම් රුපියල් මිලියන 153,212ක් විය (2013 ප්‍රථම භාගය අවසානයේ එය රුපියල් මිලියන

135,467කි). ඒ අනුව  දීර්ඝ කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වල වත්කම් වර්ධනය පිළිවෙලින් 12.94% සහ 13.10%ක් ලෙස දැක්විය හැකිය.




**රජයේ සුරැකුම්පත් මත ආයෝජනය**

2014 වසරේ පළමු හය මස අවසානයේදී,  මුළු දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර වත්කම්වලින් 44.67%ක් වන රුපියල් මිලියන 106,192ක් ද (2013 පළමු භාගයේදී එය රුපියල් මිලියන 97,331; 46.24%ක් ද) මුළු සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාර වත්කම්වලින් 18.60%ක් වන රුපියල් මිලියන 28,491ක් ද (2013 පළමු භාගයේදී එය රුපියල් මිලියන 26,994; 19.93%ක් විය) රජයේ සුරැකුම්පත් මත ආයෝජනය කරනු ලැබ ඇත. ඒ අනුව, 2014 ජූනි 30 දිනට සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාර තාක්‍ෂණික සංචිතයෙන් සහ ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ දීර්ඝ කාලීන රක්‍ෂණ අරමුදලේ වත්කම්වලින් කොට ඇති ආයෝජනයන් රුපියල් මිලියන 134,683ක් එනම් 34.45%ක් වේ. (2013 පළමු භාගයේදී එය රුපියල් මිලියන 124,326; 35.94%කි).

**රක්ෂණ හිමිකම් ගෙවීම් සම්බන්ධව  ආරවුල් විමර්ශණය කිරීම සහ නිරාකරණය කිරීම**

වර්ෂ 2000 අංක 43 දරන රක්‍ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන වලට අනුකූලව ශ්‍රී ලංකා රක්‍ෂණ කර්මාන්තය නියාමනය කිරීම සහ අධීක්‍ෂණය වන්නේ ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය මගිනි. රක්ෂණ ඔප්පුහිමියන්ගේ යහපත ආරක්ෂා කිරීම යන සමස්ථ අරමුණ යටතේ, රක්ෂණ සමාගම් හා රක්ෂණ ඔප්පුහිමියන් අතර රක්ෂණ හිමිකම් ගෙවීම් සම්බන්ධව  ආරවුල් සම්බන්ධයෙන් විමර්ශණය කිරීමේ සහ නිරාකරණය කිරීමේ බලය මණ්ඩලය වෙත පවරා තිබේ. තවද, රක්ෂණ සමාගමකට, රක්ෂණ තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයකු සම්බන්ධයෙන් වෙනත් ඕනෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන් ද මණ්ඩලය විමර්ශණ කටයුතු සිදු කරයි. අදාල කාලය තුළ දී මණ්ඩලය විසින් එසේ යොමු කරන ලදුව කටයුතු කරමින් සිටි පැමිණිලි/ආරවුල් 268කින් කාරණා 118ක් (44%) සම්බන්ධයෙන් වන විමර්ශණ කටයුතු අවසන් කරන ලදී. මේ අතරින් 95ක් රක්ෂණ හිමිකම් ගෙවීම්  සම්බන්ධව ආරවුල් වන අතර එයින් ආරවුල් 13කදී රක්ෂණ මණ්ඩලයේ මැදිහත් වීම මත අදාල රක්ෂණ හිමිකම් ගෙවනු ලැබීය.

**රක්‍ෂණ සමාගම්**

2014 ජූනි 30 වන විට ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය යටතේ රක්‍ෂණ සමාගම් (රක්‍ෂණකරුවෝ) විසි දෙකක් (22) ලියා පදිංචි වී ඇත. ඉන් දොළහක් (12) සංයුක්ත සමාගම් (සාමාන්‍ය සහ දීර්ඝ කාලීන රක්‍ෂණ ව්‍යාපාර) වන අතර හතක් (07) සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාරයේද, තුනක් (03) දීර්ඝ කාලීන (ජීවිත) රක්‍ෂණ ව්‍යාපාරයේද නියුක්තව සිටී. සීමාසහිත සෙලින්කෝ තකාෆුල් 2009 අගොස්තු 05 වැනිදා සිට රක්‍ෂණ ව්‍යාපාරයේ යෙදීම තහනම් කොට ඇත. ශ්‍රී ලංකාවේ රක්ෂණ කටයුතුවලින් ඉවත්වීමට සීමාසහිත ඒඅයිජී ඉන්ෂුවරන්ස් සමාගම තීරණය කර තිබෙන බව රක්ෂණ මණ්ඩලයට දැනුම් දී ඇති අතර, දැනට ව්‍යාපාරික කටයුතු අවසන් කිරීමේ සැලැස්මක එම සමාගම යෙදී සිටී.

**රක්‍ෂණ තැරැව්කාර සමාගම්**

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි රක්‍ෂණ තැරැව්කාර සමාගම් 57ක් ප්‍රධාන වශයෙන් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කේන්ද්‍ර කොටගෙන රක්‍ෂණ තැරැව්කාර ව්‍යාපාරයේ යෙදී සිටිති. 2014 ප්‍රථම භාගයේ දී රක්‍ෂණ තැරැව්කාර සමාගම් මගින් සාමාන්‍ය රක්‍ෂණ ව්‍යාපාරවලින් ජනනය කළ කොමිස් ආදායම රුපියල් මිලියන 788ක් වූ අතර (2013 පළමු භාගයේදී එය රුපියල් මිලියන 752කි) දීර්ඝ කාලීන (ජීවිත) රක්‍ෂණ ව්‍යාපාරවලින් ජනනය කරන ලද කොමිස් ආදායම රුපියල් මිලියන 8කි (2013 පළමු භාගයේදී එය රුපියල් මිලියන 10කි). රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවලින් උපයන ලද මුළු කොමිස් ආදායම රුපියල් මිලියන 796ක් ද විය. ඊට සාපේක්‍ෂව 2013 ප්‍රථම භාගයේදී ජනනය කළ මුළු ආදායම රුපියල් මිලියන 762ක් වූ අතර එය ප්‍රතිශතයක් වශයෙන් 4.46%ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

*සටහන්*

1. *විගනණයට පෙර ලබාගත් දත්ත.*
2. *ජාතික රක්ෂණ භාර අරමුදල විසින් උපයනු ලබන වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී විපත් අරමුදලේ වාරික ආදායම රක්ෂණ සමාගම්වල දළ ලිඛිත වාරිකයට ඇතුළත් කර නැත.*
3. *ඉහත විශ්ලේෂණයේ වත්කම්වල අන්තර් අංශ ගණුදෙනු (ජීවිත සහ සාමාන්‍ය අංශ අතර) සළකා බලා නැත.*
4. *ඉහත විශ්ලේෂණය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ දත්ත ඇතුළත් කර නැත.*


| | |
|---|---|
| වෙබ් අඩවිය: www.ibsl.gov.lk | විද්‍යුත් තැපෑල: info@ibsl.gov.lk |
| දුරකථන: 011 2396184 -9 | ෆැක්ස්: 011 2396190 |

**ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය**

11 වන මහල, නැගෙනහිර කුළුණ

ලෝක වෙළඳ මධ්‍යස්ථානය

කොළඹ 01


05/12/2014